# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2471/55 - 2026 ජනවාරි මස 16 වැනි සිකුරාදා - 2026.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව, මේ නියමය මගින්, 2025 ජූලි 14 වැනි දින අංක, 2445/03 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි :-

(1) ඒ නියමයේ III වන උපලේඛනයේ -

(අ) ඒ උපලේඛනයේ අයිතම අංක 3 සහ 4 ඉවත් කිරීමෙන්; සහ

(ආ) ඒ උපලේඛනයේ 10 වන අයිතමයෙහි, “මේ පනතේ සියලුම විධිවිධානවලින් නිදහස් වන්නේ ය.” යන වචන වෙනුවට, “මේ පනතේ 2 වන, 11 වන සහ 12 වන වගන්තිවලින් නිදහස් වන්නේ ය.” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ නියමයේ IV වන උපලේඛනයේ අයිතම අංක 3 සහ 4 ඉවත් කිරීමෙන්.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 ජනවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0172


1A - PG 7475 — 378 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*